# ගුරුළුගෝමීන්ගේ හා විද්‍යාචක්‍රවර්තීන්ගේ භාෂා රීතින්හි විශේෂතා

බී. ධම්මකුසල හිමි
සහකාර කථිකාචාර්ය,
සිංහල අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය.

සිංහල භාෂා සාහිත්‍යයේ ආරම්භක අවධිය ලෙස සැලකෙන අනුරාධපුර යුගය දසවන සියවසේ දී පමණ විදේශීය ආක්‍රමණ හා අභ්‍යන්තර වියවුල් නිසා බිඳවැටීමෙන් පසු පොළොන්නරු යුගය ආරම්භ වෙයි. පළමුවන විජයබාහු රජුගෙන් ආරම්භ වූ පොළොන්නරු යුගයේ මුල්කාලීනව පැවති අර්බුදකාරී දේශපාලන, සමාජීය හා ආගමික පසුබිම තුළ සිංහල සාහිත්‍යයේ දියුණුවක් සිදු නොවුව ද පළමුවන පරාක්‍රමබාහු රජුගේ අවධියේ දේශපාලනිකව ඇති වූ සාමකාමී වටපිටාව නිසා සිංහල සාහිත්‍යයේ විශාල දියුණුවක් විද්‍යමාන වේ. සොළී ආක්‍රමණිකයන්ගේ බලපෑමත්, හින්දු ආගමික බලපෑමත් නිසා පොළොන්නරු යුගයේ සංස්කෘත භාෂාවන්ට සුවිශේෂී තැනක් හිමි වූ අතර සිංහල භාෂාව හා සාහිත්‍යය කෙරෙහි සංස්කෘත භාෂාවේ බලපෑම පොළොන්නරු යුගයේ ඉතා ප්‍රබල ලෙස විද්‍යමාන වේ. භික්ෂූන් අතර පැවති නිකාය භේදය දුරු කොට උන්වහන්සේලා අතර සමගිය ඇති කිරීමේ අරමුණින් පිහිට වූ පොළොන්නරු ගල් විහාරයේ පොළොන්නරු කතිකාවත ඇතුළු සෙල්ලිපිත් මහාවංශය වැනි වංශකථා සාහිත්‍යයත් සිංහල භාෂාවට සංස්කෘත භාෂාවේ බලපෑම සෘජුව ම එල්ල වූ යුගයක් ලෙස පොළොන්නරු යුගය හඳුනා ගැනීමට ඇති ප්‍රබල සාධක වේ. සංස්කෘත පද බහුල සිංහල භාෂාව පොළොන්නරු යුගයේ සිංහල භාෂාවේ යුගාවේණික භාෂා රීතියක් ලෙස හඳුනා ගැනීමට පිළිවන.

සිංහල ගද්‍ය සාහිත්‍යයේ ආරම්භක අවධිය ලෙස පොළොන්නරු යුගය විද්වතුන් විසින් හඳුන්වාදෙනු ලැබේ. ගුරුළුගෝමීන් විසින් රචිත ධර්මප්‍රදීපිකාව හා අමාවතුර මුල්ම සිංහල ගද්‍ය සාහිත්‍යය කෘති ලෙස පිළිගැනෙයි. බුත්සරණ රචනා කළ විද්‍යාචක්‍රවර්තීන් පොළොන්නරු යුගයේ වාසය කළ ගුරුළුගෝමීන්ගේ සමකාලීන ලේඛකයෙකි. බෞද්ධ ත්‍රිපිටක සාහිත්‍යය හා අට්ඨකථා ආදී පාලි මූලාශ්‍ර මූලික කර ගනිමින් මුල්කාලීන ගද්‍ය රචකයන් සිංහල ගද්‍ය කෘති රචනා කළ බව ගුරුළුගෝමීන්ගේ හා චක්‍රවර්තීන්ගේ සිංහල ගද්‍ය සාහිත්‍ය කෘති අනුව පැහැදිලි වේ. සංස්කෘත වදන් බහුල සිංහල භාෂාව පොළොන්නරු යුගයේ සිංහල භාෂා රීතිය වුව ද ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් විසින් ගද්‍යකරණය සඳහා භාවිත කෙරුණු භාෂාව අධ්‍යයනය කළ උගත්හු යුගාවේණික භාෂා රීතිය භාවිත වුව ද ඔවුනටම ආවේණික වූ පුද්ගල රීතියක් ද ගද්‍ය කරණයේදී භාවිත කෙරුණු බව ප්‍රකාශ කරති.

ගුරුළුගෝමී භාවිත කළ භාෂාව පිළිබඳ —සිංහල සාහිත්‍ය වංය˜ කෘතියේ දී පී.බී. සන්නස්ගල මහතා අදහස් දක්වමින්, ධර්මප්‍රදීපිකාවෙහි ඇතැම් කොටස් සංස්කෘත රීතියට නැඹුරු වීමත් අමාවතුර රචනයේ දී පාලි රීතියට ගරු කිරීමත් ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි බව ප්‍රකාශ කරයි. (පී¡බී¡සන්නස්ගල, 1964: 103 - 110 පිටු) භාෂාව ශෛලිය හා විෂය අතින් ගුරුළුගෝමීන්ගේ ගත් දෙක එකිනෙකට කොතරම් වෙනස්ද යත් ධර්මප්‍රදීපිකාව ගැන අමාවතුරේ සඳහන්ව තිබුණේ නැති නම්, ඒ දෙකම ලියුවේ එක් කතුවරයෙකැයි යන පරම්පරා ගත මතය සැකයට භාජනය වනු නිසැකය¡ (මහාචාර්ය හේමචන්ද්‍ර රාය මහතා (ප්‍ර¡සං¡), 1972: 550 පිට)

විද්‍යාචක්‍රවර්තීන්ගේ භාෂා රීතිය පිළිබඳව අධ්‍යයනය කරන මාර්ටින් වික්‍රමසිංහ මහතා ,සිංහල සාහිත්‍ය නැගීම, කෘතියේ දී ප්‍රකාශ කරන්නේ එය දේශීය මාර්ගයෙන් සම්පූර්ණයෙන් ඉවත් නිස්සාර සංස්කෘත රීතියට වහල් වූ බවයි. (මාටින් වික්‍රමසිංහ, 1997: 67 පිට)

විද්වතුන් විසින් ඉදිරිපත් කෙරෙන මතවලට අනුව පැහැදිලි වන්නේ පොළොන්නරු යුගයේ ගද්‍යකරණයේ නියුතු ගුරුළුගෝමීන් සහ විද්‍යාචක්‍රවර්තීන් යුගයේ පැවති සිංහල භාෂා ලේඛන සම්ප්‍රදායේ බලපෑම අභිබවා පුද්ගල රීති ලෙස අධ්‍යයනය කළ හැකි ඔවුන්ට ආවේණික වූ භාෂා රීති ගද්‍යකරණය සඳහා නිර්මාණය කරගෙන ඇති බවයි. නමුත් ඔවුන් භාවිත කළ එම පුද්ගල රීතියෙහි පවා සම විෂමතා පවතින බව විද්වතුන්ගේ අදහසයි. පොළොන්නරු යුගයේ පැවති භාෂා රීතිය අධ්‍යයනය කිරීම මෙන්ම පොළොන්නරු යුගයේ ගද්‍ය රචනයන් ගද්‍යකරණය සඳහා භාවිත කළ පුද්ගල රීතීන් මූලික වශයෙන් මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කෙරෙයි. විශේෂයෙන් එකම යුගයක ගද්‍යකරණයේ නියුතු ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් ගද්‍යකරණය සඳහා භාවිත කළ භාෂා රීතීන් අධ්‍යයනය කරන අතරම එබඳු විවිධ භාෂා රීතීන් විද්‍යමාන වන්නේ ඇයි ද යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වෙයි.

පර්යේෂණය මූලාශ්‍ර අධ්‍යයනය මගින් සිදු කෙරෙන අතර ප්‍රාථමික මූලාශ්‍ර ලෙස ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව, අමාවතුර හා විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණත් ද්විතීක මූලාශ්‍ර ලෙස අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ ප්‍රාමාණික විද්වතුන් විසින් රචිත පොත්පත් හා ලිපි ලේඛනත් යොදා ගැනෙයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. රායා හේමචන්ද්‍ර (ප්‍ර¡සං¡) (1972)¡**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය¡** කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය¡
2. වික්‍රමසිංහ මාර්ටින් (1997)¡ **සංහල සාහිත්‍ය නැගීම¡** දෙහිවල: සීමාසහිත තිසර ප්‍රකාශකයෝ¡
3. සන්නස්ගල, පී¡බී (1964)¡ **සිංහල සාහිත්‍යවංශය¡** කොළඹ: ලේක්හවුස් මුද්‍රණාලය¡


# Fertility levels of Sinhala and Muslim communities: A comparative study in the Dickwella Division


*R. Srikanthan & Asmiya Rajoon*

*Department of Geography*


Fertility denotes successful production of offspring. It is the natural capability of living beings to give life. In demography, fertility refers to the actual number of children born rather than the physical capability to produce children (fecundity). Human fertility depends on several factors such as nutrition, sexual behavior, culture, ethnicity, way of life, use of contraception socio economic determinants, nuptiality patterns and emotions. This study attempts to investigate the extent to which ethnicity and related factors have influenced the rates of fertility within each of the ethnic groups selected in the study area.

As the main purpose of the study was to ascertain the region-specific differences in the fertility levels between the Sinhala and the Muslim communities, the Dickwella D.S. division in the Matara division was chosen for a close study. The reason being that, unlike in the whole district of Matara where the population is comprised of three communities namely the Sinhala (90%). Muslim (7%) and Indian Tamils (3%), the study area consisted of the two primary communities chosen for this study, namely the majority community (Sinhalese) and one of the minority communities (Muslims). Besides achieving the major objective of analyzing the differences in the fertility levels between the Sinhala and Muslim communities this study also aimed at identifying the factors that contributed to these differences by investigating the extent to which the socio-economic disparities (if any) had impinged on the differences in the fertility levels and the extent to which the population policies at the national level had impacted on the fertility levels of the two said communities.